# 22
# ප්‍රේමයේ ජීවිත

බයිබල් පාඨ 1 කොරින්ති 13 ඃ 4 8 , රෝම 12 ඃ 9 14 ශු. මතෙව් 19 ඃ 14 , ශු. ජොහාන් 13 ඃ 34 35

ක්‍රිස්තු ධර්මයේ හරය ක්‍රිස්තුස් වහන්සේ තුළින් දිස් වූ දෙවියන් වහන්සේ ගේ ප්‍රේමය යි. කිතුනු අපේ ජීවිත තුළින් මේ ප්‍රේමයේ රැස් නිතර නික්මීම අපේක්ෂිත යි. මේ ප්‍රේමය අප නිතර ආශ්‍රය කරන අය තුළින් ද අප තුළින් ද අත් දැකිය යුතු ය.

අඹු සැමි යුවලක් අතර ප්‍රේමය ඔවුහු අත් දකිති. මේ ප්‍රේමය වර්ධනය වීම පදනම් කර ගෙන ඔවුහු තම දරුවන්ට පරාර්ථකාමී ප්‍රේමයක් දක්වති. ඊට ප්‍රතිචාරයක් වශයෙන් දරුවෝ ඔවුන්ගේ දෙමාපියන්ට අවංක ලෙස ප්‍රේම කිරීමට නැඹුරු වෙති. ඒ නමුත් සහෝදර සහෝදරියන් අතර ප්‍රේමය හට ගන්නේ ක්‍රමයෙන් බව පිළිගත යුතු යි. එහෙත් පොදු ජීවිත අත්දැකීම්වලට මුහුණ දීමෙන් දෙමාපියන් ගේ ප්‍රේමය එක හා සමාන ව බුක්ති විඳීමට හැකි වීම තුළ ඔවුන් අතර නොසැලෙන ප්‍රේමයක් වර්ධනය වීමට ඉඩ තිබේ. පවුල් ජීවිත ස්ථිර පදනමක් මත, එනම් ක්‍රිස්තුස් වහන්සේ තම ශ්‍රාවකයන් සමඟ සහාවාසී වූ ලෙස ම ගොඩනැඟීමෙන් ඉහත විස්තර කරන ලද ප්‍රේමනීය සබැඳියාව පවුල් තුළ වර්ධනය කර ගත හැකි ය.

න්‍යෂ්ටික පවුල තුළ හටගන්නා ප්‍රේමය අන් අයට ද විසිරී යෑම අපේක්ෂිත ය. ආච්චි සීයා ඇතුළු තම දෙමාපියන්ගේ ඥාතීන් කෙරෙහි මෙත් සිත් යොමු කිරීමට කිතුනු දරුවෝ නිරායාසයෙන් මෙන් පුහුණුවක් ලබති. ජේසුස් වහන්සේ පවුල් ජීවිතය අගය කළ බව බයිබලයේ නොයෙක් අවස්ථාවල දී ඉස්මතු කෙරේ. එහෙත් උන්වහසේ තමා දිවිලත් නිවසට සීමා නොවී අලුත් පවුල් සංකල්පයක් දානය කරමින් ශ්‍රාවකයන් අතර ඉතා සමීප සම්බන්ධතා වර්ධනය වීමට සැලැස් වූ සේක. උන්වහන්සේ එක් අවස්ථාවක දී පැවසූ වදන් ගැන මෙනෙහි කිරීම යෝග්‍ය ය. " මාගේ මෑණියෝත් මාගේ සහෝදරයෝත් ...... ( ශු. ලූක් 8 ඃ 21 )

අප පවුල තුළ අප අත් දකින ප්‍රේමය අපගේ අසල්වැසියන්ට ද දැක්විය යුතු ය. කිතුනු අපට මෙය ඉතා වැදගත් කාර්යයකි. දස පනත පනත් දෙකකින් ජේසුස් වහන්සේ අපට ඉදිරිපත් කළ සේක. එනම් " දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම ද, ඒ ලෙසම නුඹේ අසල් වැසියන්ටත් ප්‍රේම කරන්න." යන (ශු.ලූක් 10 ඃ 27) වශයෙන් ය. අපගේ අසල් වැසියන්ට උදව් උපකාර කිරීම කිතුනු අපගේ පරම යුතුකම ය.

මෙලෙස තම සැපවත් ජීවිත පරිත්‍යාග කර ලංකාවට පැමිණි අප රටේ දුෂ්කර පළාත්වල තම ජීවිත ගත කළ කාන්තාවන් ගැන ඔබ මීට පෙර අසා ඇත. ඔවුහු බොහෝ දුෂ්කරතා මධ්‍යයෙහි ජීවත් වෙමින් එම පළාත්වල ජීවත් වූ දුගී දුප්පත් ජනතාව ඔවුන් සිටියා වූ ඒ තත්ත්වයෙන් මුදාලීමට බොහෝ වෙහෙස මන්සි වූහ.

**බෙකර් සොහොයුරිය** පරන්තන් හී ජීවත් වෙමින් තරුණයන් සඳහා "නව ජීවනම්" යන නිවාස ගරු තම්බිරාජ පියතුමා සමඟ ගොඩනැගුවා ය. මෙම නිවාස අනාථ දරුවන් හා අසරණ වූවන් නැවත හැඩ ගස්වන නිවසක් විය.

**ඉව්ලින් කානි** තලාව නැමැති දුෂ්කර ගම්මානයක පදිංචි ව එහි සිටි දුප්පත් අසරණ ජනතාවට මහගු සේවයක් කළා ය.ඇය ව " සුදු අම්මා " වශයෙන් ගම්මු හැඳින්වූවෝ ය. ඇය ගැහැණු ළමුන් සඳහා " ප්‍රීති නිවස" ආරම්භ කළා ය.

**මියුරියල් හචින්ස්** කිලිනොච්චි නම් නගරයේ පදිංචි ව සිට එහි ගම්මුන්ට සේවය කරමින් අනාථ ගැහැණු දරුවන් සඳහා " කරුණා නිලියම් " නම් නිවාස ආරම්භ කළා ය.

මෙවැනි අය ඔවුන් තුළ තිබුණා වූ කිතුනු ප්‍රේමය නිසා අසල්වැසියන් වෙනුවෙන් මෙවැනි සේවයක් ඉටු කර ඇත.

පාවුල් තුමා ජේසුස් වහන්සේගේ ප්‍රේමය තමා ලැබූ අත් දැකීම මත පිහිටා 1 කොරින්ති 13 සඳහන් වන "ප්‍රේමයේ පාරමිතාව" ඉදිරිපත් කරයි. එම ප්‍රේමයේ ලක්ෂණ අප කිසිවකු තුළ සම්පූර්ණ ලෙස නොපවතින බව අපි දනිමු. එහෙත් අපේ අධිෂ්ඨානය ජේසුස් වහන්සේ තුළ දිස් වූ ප්‍රේමය අප තුළ ද වර්ධනය කිරීම යි.

".......... ප්‍රේමය මට නැත්නම් මම කරන්නා වු ඕනෑම හොඳ කටයුත්තක් ඝෝෂා කරන ඝණ්ඨාරයකට හෝ කටුක රාවය දෙන කෛතාලමකට සමාන ය."

" කොපමණ බලවන්තයෙක් වුවත් ප්‍රේමය නැත්නම් හිස් තැනැත්තෙක් වශයෙන් ගණන් ගනු ලැබේ. "

" ප්‍රේමය ඊර්ෂ්‍යා නොකරයි. ඉවසිලිවන්තය. කරුණාවන්තය .......... "
" සියල්ල දන් දුන්නත්, සිරුර ගිනි පූජාවක් සඳහා බිලි දුන්නත් ප්‍රේමය නැත්නම් කිසි පලක් නැත"

ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ ඉදිරිපත් කළේ "ප්‍රේමනීය පියකු" ලෙස යි. ජේසුස් වහන්සේ කළ කී සෑම දෙයක් තුළින් ම එම පියවූ දෙවියන් වහන්සේගේ ප්‍රේමය විදහා පෑ සේක. ජේසුස් වහන්සේ ගේ ප්‍රේමය ක්‍රියාකාරී ප්‍රේමයකි. උන්වහන්සේ විසූ සමාජයේ ප්‍රේමය නොලත් අය ගැන එතුමා සැලකිලිමත් වූ සේක. ලාඳුරු රෝගියකු සුව කිරීමේ දී එදා සමාජ සම්ප්‍රදායන් ඉවතලමින් ඔහු පිට අත් තැබීමට උන්වහන්සේ ඉදිරිපත් වූයේ එවැනි

රෝගීන් සමාජයෙන් බැහැර නොවන බව පෙන්නුම් කිරීමට ය. (මාක් 1 ඃ 42 ) උන්වහන්සේ පව්කරුවන් සැලකුවේ නැති වූ බැටළුවන් හා නොමග යවන ලද බැටළුවන් ලෙස ය. දෙවියන් වහන්සේ " මාගේ එඬේරාය යන්න" යුදෙව්වන් අතර දෙවියන් වහන්සේ පිළිබඳ ඉතා ජනප්‍රිය වූ සංකල්පයකි. මේ අනුව පව්කරුවන් හා පව්කරුවන් ලෙස කොන් කරන ලැබූ අය ආශ්‍රය කරමින් ජේසුස් වහන්සේ ඔවුන් කෙරෙහි දක්වන කරුණා බරිත ප්‍රේමය උන් වහන්සේ පැහැදිලි කළ සේක.

පව්කාර ස්ත්‍රිය සාකෙවුස් වැනි සමාජයෙන් කොන් කරන ලද අයට දැක් වූ එතුමාගේ උදාරතර ප්‍රේමය නිසා ඔවුන්ගේ ජීවිත තුළ පවා විශාල වෙනසක් ඇති විය.

කාන්තාවන් පිළිබඳ ජේසුස් වහන්සේ දැක් වූ ආකල්පය අනුව දෙවියන් වහන්සේ පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට එක හා සමාන ව ප්‍රේමකරන බව පෙන්නුම් කරන සේක. " ඔබ දැරූ කුසය ද ඔබට කිරි දුන් පියයුරු ද භාග්‍යවන්ත ය. " (ලූක් 11 ඃ 27 ) පැවසූ කාන්තාවට ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ කාන්තාවක් දරුවන් ඇති දැඩි කරමින් සෑහීමට පත්වනවාට වඩා දේව රාජ්‍ය වෙනුවෙන් ක්‍රියා කිරීම වඩා භාග්‍යවන්ත බව ය. කාන්තාව පුරුෂයා හා සමාන ව දේව රාජ්‍යයේ ක්‍රියා සඳහා යොමු විය යුතු බව පෙන්නුම් කළ සේක.

එකල යුදෙව්වරු තම දරුවන්ගේ මතු අධ්‍යාපනය ගැන සලකා ගෙන ඔවුනට ආශිර්වාදයක් ලබා දීම සඳහා රබ්බීන්වරුන් වෙත ඉදිරිපත් කිරීමට පුරුදු ව සිටියහ. මේ අනුව ජේසුස් වහන්සේ වෙත ඔවුන් බිළිඳු දරුවන් ඉදිරිපත් කළ අවස්ථාවක් ගැන මතෙව් 19 ඃ 14 කියවේ. එම අවස්ථාවේ දී ජේසුස් වහන්සේ එම දරුවන්ට ආශිර්වාද කළා පමණක් නොව උන් වහන්සේ ඔවුන් වඩාගෙන ඔවුන් කෙරෙහි ප්‍රේමය දැක් වූ අන්දම අප සියලු දෙනාගේ ම මතකයේ රැඳේ. මේ අනුව ජේසුස් වහන්සේ දරුවන් ගැන විශේෂයෙන් ම සැලකිලිමත් වීමට ඔවුන්ගේ වර්ධනයට අවශ්‍ය වන ප්‍රේමය ලබා දීමට අපට අභියෝග කළ සේක.

සතුරන්ට ප්‍රේම කිරීමට ඉගැන්වූ ජේසුස් වහන්සේ ඒ සම්බන්ධයෙන් ආදර්ශමත් වූ අන්දම අප මවිතයට පත් කරයි. උන් වහන්සේ පාවා දුන් යුදස්ට අන්තිම රාත්‍රී භෝජනය පැවැත් වූ අවස්ථාවේ දී විශේෂ රොටී කැබැල්ලක් පිළිගැන්වූ බව ( යොහාන් තුමා 13 ඃ 26) පැවසේ . මෙය විශේෂ ආරාධිතයකුට ගෞරවාදාරය දැක්වීමේ ක්‍රියාවකි. මේ මොහොතේ පවා ජේසුස් වහන්සේ ඔහුට ප්‍රේමය දැක් වූ අන්දම ඉතා පුදුම ය. ගෙත්සෙමෙනේ උයනේ දී පවා යුදස් සිඹීමකින් ජේසුස් වහන්සේ පාවා දුන් අවස්ථාවේ දී ජේසුස් වහන්සේ එම වැළඳ ගැනීමට සහභාගීවන්නට ඇතැ යි යන්න නොඅනුමාන ය. තව ද එතුමා ව කුරුසයේ ඇණ ගැසූ අවස්ථාවේ දී පළමු ව දෙව් පියාගෙන් ඉල්ලා සිටියේ උන්වහන්සේ කුරුසයේ ඇණ ගැසූ අයට කමාවන ලෙස ය. ( ශු. ලූක් 23 ඃ 34)

ජේසුස් වහන්සේ පරාර්ථකාමී ප්‍රේමය අනුගමනය කිරීමට පෙළඹීමක් රෝම 12 : 9 14 සඳහන් වේ. යුදෙව් ව්‍යවස්ථාව අනුව තමාට මෙන් තමාගේ අසල් වැසියන්ට ප්‍රේම කිරීම සෑහේ .එහෙත් ජේසුස් වහන්සේගේ විශේෂ අඥාව වූයේ " මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න යන්නයි."
(ශු. යොහාන් 13 : 34 )

රෝම 12 : 10 අනුව මෙම ප්‍රේමය දැක්වීමේ දී ගෞරවයෙන් තමාට වඩා අනෙක් අය උතුම් කොට සැලකීමට අප ව යොමු කෙරේ.

පාවුල් තුමා (රෝම 12 : 9 ) ක්‍රිස්තියානි ජීවිතයේ ප්‍රතිපත්ති යන මාතෘකාව යටතේ කිතුනු ප්‍රේමය විග්‍රහ කර ඇත.

" ප්‍රේමය අවංක වේවා,
නපුර පිළිකුල් කොට යහපතට ඇලුම් වන්න.
සුහද සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට ප්‍රේම කරන්න......
ඔබට පීඩා කරන්නන්ට ආශිර්වාද කරන්න......
ප්‍රීති වන්නන් සමඟ ප්‍රීති වන්න.
ශෝක වන්නන් සමඟ ශෝක වන්න.

කිසිවකුට නපුරට නපුර නොකරන්න......
සියල්ලන් ඉදිරියෙහි උසස් යයි සම්මත දේ කිරීමට සිතට ගන්න.
ඔබට හැකි පමණට හැම දෙනා සමඟ සාමකාමී ව සිටීමට උත්සාහ කරන්න.
පළි ගැනීමෙන් තොර ව දේව උදහස ක්‍රියා කිරීමට ඉඩ හරින්න.

පාවුල්තුමාගේ මෙම විග්‍රහය අනුව අප ගේ ජීවිත හැඩ ගස්වා ගතහොත් ජේසුස් වහන්සේ දේශනා කළ දේව රාජ්‍ය මිහි පිට පිහිටවීම ඉතා පහසු වනු ඇත.

මෙලොව වසන සියලු සත්වයන්ට ප්‍රේමය අවශ්‍යය. අපගේ ගෙදර ඇති කරන සුරතල් සතුන් අපගේ ප්‍රේමය කොපමණ බලාපොරොත්තු වන්නේ දැ යි ඔබ දන්නවා ඇත. දෙවියන් වහන්සේ ලෝකය මවා එය රැක බලා ගැනීමට අපට බාර දුන් සේක. ලොව ඇති සියලු දේ ගැන අපට වගකීමක් ඇත. එබැවින් සියලු ගස් වැල්, ගංගා ඇළ දොළ, සතුන් සිවුපාවුන්ට හානි නොකර ආදරයෙන් රැකබලා ගැනීම කිතුනු අපගේ වගකීම යි.

සත්වයින්ගේ ජීවිතවලට ප්‍රේමය අවශ්‍ය සේ ම සියලු මනුෂ්‍යයින්ට මෙලොව සතුටින් ජීවිකාව ගෙවීමට ප්‍රේමය අවශ්‍ය ය. අපි ගෙදර දී අත් දකින ප්‍රේමය ගෙදරින් පිට යන විට එහි දී මුණ ගැසෙන අය කෙරෙහි ද දැක්වීමට පුරුදු වෙමු. පාසලේ මුණ ගැසෙන මිතුරු මිතුරියන්ට ද ගුරුවර ගුරුවරියන්ට ද ආදරය දැක්වීමට දරුවෝ යොමු වෙති.

ක්‍රමයෙන් වැඩිවියට පැමිණෙන විට ගැහැණු දරුවන් පිරිමි දරුවන් කෙරෙහි ද පිරිමි දරුවන් ගැහැණු දරුවන් කෙරෙහි ද ආදරය දැක්වීම ස්වාභාවික ය. මෙම වයසේ දී මෙම මිත්‍ර සම්බන්ධකම් වැදගත් කමක් උසුලයි . එයට හේතුව මේ මඟින් පිරිමි දරුවන් ගැහැණු දරුවන්ට ද ගැහැණු දරුවන් පිරිමි දරුවන්ට ද ගෞරව කිරීමට පුරුදු වීම යි. ඒ නමුත් විශේෂ කෙනෙක් තෝරා ගෙන ප්‍රේම සම්බන්ධතා ඇති කරගැනීමට වඩා මේ වයසේ දී ඉගෙනීමේ කටයුතුවලට මුල්තැන දීමට සිසුන් කල්පනාකාරී විය යුතු ය. ඔබගේ අනාගතය රැඳී ඇත්තේ ඒ මතය අනවශ්‍ය සම්බන්ධතා නිසා ඉගැන්වීමේ කටයුතුවලට ද බාධා ඇතිවන බව මතක තබා ගත යුතු ය . පාසල් ඉගෙනුම් කටයුතු කර ගත හැක්කේ මේ වකවානුවේ පමණ ය . ඔබ වයසින් මුහුකුරා ගොස් රැකියා කරන අවදියේ දී ඔබට විවිධ පුද්ගලයින් මුණ ගැසෙනු ඇත. ඒ අවස්ථාවේ දී ඔබට ඔබගේ ජීවිත සහකාරිය හෝ සහාකාරයා තෝරා ගැනීම සිදු  කර ගත හැකි ය. මේ මඟින් සාර්ථක යුග දිවියකට අත්තිවාරම් දැමීමක් වනු ඇත . එම තෝරා ගැනීම  බුද්ධිමත් ව හැඟීම්වලට වහල් නොවී කිරීම වැදගත් වේ .

❖ **ඇගැයීම :-**

1. කිතුනු ප්‍රේමය විදහා දැක්වීමට පාසලේ හෝ සමාජයේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න .

2. ජේසුස් වහන්සේ ඉදිරිපත් කළා වූ ප්‍රේමයේ ප්‍රතිපත්ති ලියා ඒවායෙහි ඇති විශිෂ්ට වටිනාකම් පැහැදිලි කරන්න .

3. "වයස අවුරුදු 5 න් පහළ දරුවන් ඇති මව්වරුන් පිටරට රැකියාවට යාම සුදුසු ද? නැද්ද ? " සාකච්ඡා කරන්න / විවාදයක් පවත්වන්න .

4. පිලිප්පි 2 : 1  2, එපිස 3: 14  19, 1 කොරින්ති 13, මේ කොටස්වල ප්‍රේමය ගැන සඳහන් වී ඇති කරුණුවලින් ඔබට වැටහෙන අදහස් ගොනු කරන්න .